ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකː 2477424, 2477423, 2477311
ෆැක්ස්ː 2346257, 2477739
ඊ-මේල්ː dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියː www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | 2017 **ජනවාරි මස** 11 **වැනි දින** |

## 2016 සැප්තැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළඳ හිඟය අඩු වීම සහ සංචාරක ඉපැයීම්වල අඛණ්ඩ ඉහළ යාමත් සමඟ 2016 සැප්තැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය විය. අපනයන ආදායම ඉහළ යාම සමඟම ආනයන වියදම පහළ යාම හේතුවෙන් සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ හිඟය අඩු විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සුළු අඩු වීමක් පෙන්නුම් කළ ද, 2015 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2016 සැප්තැම්බර් මාසය තුළ දී සංචාරක ඉපැයීම් වර්ධනය විය. තවද, කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන සහ රජය වෙත වූ දිගුකාලීන ණය ලැබීම් 2016 සැප්තැම්බර් මාසය තුළ මූල්‍ය ගිණුම ශක්තිමත් කිරීම සඳහා දායක විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2016 සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව දෙවැනි මාසයටත් ඉහළ ගියේය. ඒ අනුව, 2016 සැප්තැම්බර් මාසයේ අපනයන ආදායම 2015 සැප්තැම්බර් මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 850 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 898 ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලක්ම මෙම වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, ප්‍රවාහන උපකරණ, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ රබර් නිෂ්පාදිත මූලික

කරගත් කාර්මික අපනයන, මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අතර, තේ මූලික කරගත් කෘෂිකාර්මික අපනයන දෙවනුව දායක විය. සිංගප්පූරුව වෙත නැවක් අපනයනය කිරීම හේතුවෙන් 2016 සැප්තැම්බර් මාසයේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 31 ක් දක්වා පස් ගුණයකට වඩා වැඩි අගයකින් ඉහළ ගිය අතර, විවිධ ආහාර සැකසුම්වල ඉහළ ක්‍රියාකාරිත්වය නිසා ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයනය ඉහළ ගියේය. රබර් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.3 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් රබර් ටයර් අපනයනවල වර්ධනය හේතු විය. මේ අතර, රබර් නිෂ්පාදිත අපනයනවලට අයත් අනෙකුත් සියලුම උප කාණ්ඩවල ද සතුටුදායක ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. සාමාන්‍ය අපනයන මිල සහ අපනයන පරිමාව යන දෙයාකාරයෙන්ම ඉහළ යාමක් පිළිබිඹු කරමින් 2016 සැප්තැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 8.0 ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2016 සැප්තැම්බර් මාසයේ දී ඉහළම තේ අපනයන ආදායම ඉරානයෙන් ලැබුණු අතර, එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 41.0 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මේ අතර, මුළු තේ අපනයන ආදායමෙන් සියයට 43 කට දායක වූ මැදපෙරදිග කලාපය වෙත කළ තේ අපනයනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 15.9 ක වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, 2016 සැප්තැම්බර් මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන වටිනාකම සහ පරිමාව යන දෙයාකාරයෙන්ම වර්ධනය වූ අතර, යුරෝපා සංගමය වෙත සිදු කරන ලද මුහුදු ආහාර අපනයන ආදායම, මුළු මුහුදු ආහාර අපනයන ආදායමෙන් සියයට 28.7 කට දායක විය. එසේම, යුරෝපා සංගමය වෙත කරන ලද මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව දෙවැනි මාසයටත් සියයට 200 කට වඩා ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාව වෙත පනවා තිබූ මත්ස්‍ය අපනයන තහනම ඉවත් කිරීම හේතු විය.

මෙම තත්ත්වයට වෙනස්ව යමින්, මුළු අපනයන ආදායමෙන් සියයට 43 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 382 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව දෙවැනි මාසයටත් සියයට 7.1 කින් අඩු වූ අතර, ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය වැනි සාම්ප්‍රදායික වෙළඳපොළ වෙතින් පැවති ගෝලීය ඉල්ලුමෙහි තාවකාලික පහළ යාම හේතු විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු මාස නවය තුළ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 7,763 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 3.0

කින් අඩු වූ අතර, ප්‍රවාහන උපකරණ හා ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායමේ අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට අමතරව, තේ සහ කුළුබඩු වැනි කෘෂිකාර්මික අපනයනවල අඩු වීම ද මෙම කාලපරිච්ඡේදය තුළ අපනයනවල අඩුවීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, 2016 වසරේ පළමු මාස නවය තුළ දී සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කළ  අපනයනවල ඉහළ යාම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 2.4 කින් ඉහළ ගියේය. 2016 වසරේ පළමු මාස නවය තුළ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ වූ අතර, එම රටවලට කළ අපනයන මුළු අපනයනයෙන් සියයට 52 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම**

| කාණ්ඩය | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **636.4** | **669.6** | **5.2** | **6,091.4** | **5,984.3** | **(1.8)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 411.2 | 382.2 | (7.1) | 3,629.9 | 3,715.8 | 2.4 |
| රබර් නිෂ්පාදිත | 58.6 | 67.5 | 15.3 | 583.5 | 575.9 | (1.3) |
| ප්‍රවාහන උපකරණ | 5.3 | 31.1 | 486.3 | 225.0 | 112.0 | (50.2) |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 21.2 | 30.7 | 45.0 | 195.5 | 230.2 | 17.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.6 | 23.3 | (5.4) | 252.4 | 210.6 | (16.5) |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.3 | 11.5 | 165.8 | 42.4 | 67.3 | 58.7 |
| රසායනික නිෂ්පාදිත | 12.2 | 10.2 | (16.1) | 95.8 | 95.2 | (0.6) |
| සත්ත්ව ආහාර | 7.1 | 5.0 | (29.3) | 58.2 | 48.0 | (17.5) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 5.2 | 0.4 | (92.4) | 37.8 | 18.1 | (52.1) |
| වෙනත් | 86.7 | 107.7 | 24.2 | 971.0 | 911.1 | (6.2) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **205.6** | **224.0** | **8.9** | **1,873.5** | **1,744.6** | **(6.9)** |
| තේ | 106.3 | 114.9 | 8.0 | 1,007.5 | 949.9 | (5.7) |
| කුළුබඩු | 37.0 | 39.9 | 7.8 | 286.3 | 234.0 | (18.3) |
| පොල් | 34.6 | 37.2 | 7.4 | 272.6 | 275.5 | 1.1 |
| මුහුදු ආහාර | 10.0 | 12.3 | 22.8 | 122.5 | 123.0 | 0.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 11.4 | 10.5 | (7.9) | 118.1 | 93.9 | (20.4) |
| එළවළු | 2.1 | 2.6 | 21.4 | 22.0 | 20.8 | (5.5) |
| රබර් | 2.2 | 2.3 | 3.6 | 20.0 | 23.1 | 15.7 |
| වෙනත් | 2.0 | 4.4 | 120.4 | 24.5 | 24.3 | (0.8) |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **7.6** | **4.1** | **(46.4)** | **40.2** | **34.0** | **(15.4)** |
| **මුළු අපනයන** | **849.6** | **897.6** | **5.7** | **8,005.0** | **7,762.9** | **(3.0)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයන ක්‍රියාකාරිත්වය**

2016 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම 2015 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,543 ක් දක්වා සියයට 2.5 කින් අඩු වූ අතර, ප්‍රධාන වශයෙන් රථවාහන සහ ඉන්ධන ආනයන වියදම් අඩු වීම මේ සඳහා දායක විය. 2016 සැප්තැම්බර් මාසයේ දී මෝටර් රථ සහ දෙමුහුම් විද්‍යුත් මෝටර් රථ ආනයනය පහළ යාම නිසා පෞද්ගලික මෝටර් රථ ආනයනය සඳහා වූ වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 51.9 කින් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, 2016 සැප්තැම්බර් මාසයේ දී ඉන්ධන ආනයන වියදම 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 226 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 176 ක් දක්වා සියයට 22.1 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත ආනයන පරිමාවන් සහ සාමාන්‍ය මිල ගණන් අඩු වීම හේතු විය. 2016 සැප්තැම්බර් මාසයේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල එ.ජ.ඩොලර් 46.99 දක්වා අඩු වූ අතර එය 2015 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 48.65 ක් විය. මීට අමතරව, තිරිඟු ආනයන පරිමාව සහ සාමාන්‍ය මිල සැලකිය යුතු ලෙස අඩු වීම පිළිබිඹු කරමින් 2016 සැප්තැම්බර් මාසයේ දී තිරිඟු හා ඉරිඟු ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 48.7 කින් කැපී පෙනෙන ලෙස අඩු විය. තවද, පොහොර, ඛනිජ නිෂ්පාදිත සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම් අඩු වීම, මෙම මාසය තුළ සමස්ත ආනයන වියදම අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, 2016 සැප්තැම්බර් මාසයේ දී රෙදි සහ නූල් ආනයනය ඉහළ යාම හේතුවෙන් රෙදිපිළි සහ රෙදිපිළි උපාංග මත වූ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 සැප්තැම්බර් මාසයේ දී රත්‍රන් ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ පෙර වසරේ අනුරූප මාසයේ දී රත්‍රන් ආනයනය අඩු අගයක්ව පැවතීම හේතුවෙන් දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2016 සැප්තැම්බර් මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ, සීනි සහ රසකැවිලි වර්ග, මූල ලෝහ සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 16.7 කින්, සියයට 186.2 කින්, සියයට 61.6 කින් සහ සියයට 17.4 කින් ඉහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු මාස නවය තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 13,946 ක් දක්වා 2015 වසරේ පළමු මාස නවය අවසානයේ දී පැවැති අගයට සාපේක්ෂව සියයට 1.7 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පෞද්ගලික


රථවාහන සහ වාණිජ කටයුතු සඳහා භාවිතා කරන රථවාහන, ඉන්ධන සහ සහල් ආනයනය පහළ යාම හේතු විය. චීනය, ඉන්දියාව, සිංගප්පූරුව, ජපානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2016 වසරේ පළමු මාස නවය තුළ ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන මුළු ආනයනයෙන් සියයට 57 ක් පමණ විය.


**සංඛ්‍යා සටහන 2: ආනයන වියදම**

| කාණ්ඩය | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **392.4** | **374.8** | **(4.5)** | **3,534.8** | **3,199.7** | **(9.5)** |
| ආහාර හා පාන වර්ග | 115.4 | 144.8 | 25.5 | 1,239.8 | 1,183.9 | (4.5) |
| එළවළු | 24.3 | 28.6 | 17.7 | 293.7 | 280.3 | (4.6) |
| සීනි හා රසකැවිලි | 13.5 | 38.7 | 186.2 | 200.4 | 234.6 | 17.1 |
| කිරි නිෂ්පාදිත | 19.0 | 18.6 | (2.2) | 188.6 | 175.7 | (6.9) |
| මුහුදු ආහාර | 24.6 | 20.3 | (17.3) | 153.7 | 179.6 | 16.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 1.8 | (60.0) | 143.3 | 15.4 | (89.2) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 29.6 | 36.8 | 24.6 | 260.1 | 298.3 | 14.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 276.9 | 230.0 | (16.9) | 2,294.9 | 2,015.8 | (12.2) |
| රථ වාහන | 126.2 | 60.8 | (51.9) | 1,030.9 | 607.9 | (41.0) |
| රෙදිපිළි හා උපාංග | 36.4 | 44.4 | 22.1 | 292.0 | 287.6 | (1.5) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 114.3 | 124.8 | 9.2 | 972.0 | 1,120.3 | 15.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **829.0** | **775.6** | **(6.4)** | **7,271.7** | **7,084.6** | **(2.6)** |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 168.2 | 221.5 | 31.7 | 1,715.6 | 1,986.2 | 15.8 |
| ඉන්ධන | 226.4 | 176.3 | (22.1) | 2,061.0 | 1,677.1 | (18.6) |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 7.0 | 44.4 | 535.4 | 138.3 | 343.7 | 148.6 |
| මූල ලෝහ | 25.0 | 40.3 | 61.6 | 350.8 | 289.8 | (17.4) |
| තිරිඟු හා ඉරිඟු | 74.2 | 38.1 | (48.7) | 288.3 | 202.5 | (29.7) |
| පොහොර | 38.8 | 7.1 | (81.6) | 200.8 | 106.3 | (47.1) |
| වෙනත් | 289.5 | 247.8 | (14.4) | 2,516.8 | 2,478.9 | (1.5) |
| **3. ආයෝජන භාණ්ඩ** | **359.6** | **392.1** | **9.0** | **3,367.0** | **3,651.7** | **8.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 166.8 | 194.7 | 16.7 | 1,649.7 | 2,010.1 | 21.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 119.5 | 111.3 | (6.9) | 964.6 | 1,137.0 | 17.9 |
| ප්‍රවාහන උපකරණ | 73.0 | 85.7 | 17.4 | 749.4 | 500.0 | (33.3) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.4 | 12.9 | 3.4 | 4.5 | 34.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.8** | **0.4** | **(79.8)** | **13.3** | **9.8** | **(26.3)** |
| **මුළු ආනයන** | **1,582.7** | **1,542.9** | **(2.5)** | **14,186.7** | **13,945.7** | **(1.7)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

**වෙළඳ ශේෂය**

2016 සැප්තැම්බර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය පෙර වසරේ අනුරූප මාසයෙහි පැවති එ.ජ.ඩොලර් මිලියන 733 හි සිට එ.ජ.ඩොලර් මිලියන 645 දක්වා සියයට 12.0 කින් අඩු වූ අතර, මේ සඳහා අපනයන වර්ධනය වීමත් සමඟ ආනයන පහළ යාම හේතු විය. කෙසේ වුවද, 2016 පළමු මාස නවය තුළ සමුච්චිත වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,183 ක් වූ අතර, 2015 අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6,182 හා සැසඳීමේ දී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි.

**සංචාරක ඉපැයීම්**

2016 සැප්තැම්බර් මාසය තුළ දී 148,499 ක් වූ සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී සියයට 3.6 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ පළමු මාස නවය තුළ දී සංචාරක පැමිණීම් 1,508,405 ක් වූ අතර එය 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 1,315,839 ක සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව සියයට 14.6 ක වර්ධනයකි. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2016 සැප්තැම්බර් මස සංචාරක පැමිණීම්වල ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2016 සැප්තැම්බර් මස දක්වා වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 51.9 කට දායක විය. 2016 වසරේ පළමු මාස නවය තුළ දී සමුච්චිත

සංචාරක ඉපැයීම්[1] 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,180.9 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 2,500.0 දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2015 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 584.2 හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 577.9 දක්වා සියයට 1.1 ක සුළු අඩු වීමක් වාර්තා කළේය. කෙසේ නමුත්, 2016 වසරේ පළමු මාස නවය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මගින් වූ සමුච්චිත ලැබීම්, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 5,182.2 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 5,382.0 ක් දක්වා සියයට 3.9 කින් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

කොළඹ කොටස් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන 2016 සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 5.1 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. කෙසේ නමුත්, 2016 වසරේ පළමු මාස නවය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 19.02 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 20.44 ක ශුද්ධ ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 1.42 ක ලැබීමකින් සමන්විත විය. තවද, 2016 සැප්තැම්බර් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ, විදේශීය ආයෝජන ලෙස වූ එ.ජ.ඩොලර් මිලියන 82.2 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2016 වසරේ පළමු මාස නවය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ සමුච්චිත විදේශීය ආයෝජන 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 920.2 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 48.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. 2016 වසරේ පළමු මාස නවය තුළ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 177.6 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 866.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 පළමු මාස නවය තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 2,316.5 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 243.1 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 සැප්තැම්බර් මාසය අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.1 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.5 ක් වූ අතර මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.8 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 9.1 ක් විය.

2016 වසර අවසානයේ සිට 2017 ජනවාරි මස 10 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 0.1 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්වලට එරෙහිව සියයට 0.6 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 2.0 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 1.7 කින් සහ යූරෝවලට එරෙහිව සියයට 0.6 කින් අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 0.9 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.2 කින් අධිප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2015 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 849.6 | 897.6 | 5.7 | 8,005.0 | 7,762.9 | -3.0 |
| ආනයන | 1,582.7 | 1,542.9 | -2.5 | 14,186.7 | 13,945.7 | -1.7 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -733.0 | -645.2 | -12.0 | -6,181.7 | -6,182.9 | 0.0 |
| සංචාරක ඉපැයීම් | 237.6(ආ) | 246.1 | 3.6 | 2,180.9(ආ) | 2,500.0 | 14.6 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 584.2 | 577.9 | -1.1 | 5,182.2 | 5,382.0 | 3.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 1.3 | 5.1 | 278.4 | 9.2 | -19.0 | -307.4 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ) | 184.0 | 592.9 | 222.3 | 2,626.7 | 4,260.3 | 62.2 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 88.3 | 124.6 | 41.0 | 1,091.7 | 1,161.1 | 6.4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 650.0 | 1,500.0 | 130.8 |
| ඒකාබද්ධ ණය පහසුකම | - | - | - | - | 700 | - |
| දිගුකාලීන ණය | 93.7 | 468.0 | 399.4 | 823.2 | 1,585.2 | 92.6 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 533.8 | 335.9 | -37.1 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඇ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.